*සැ. යු.* - 2014.02.13 දින පළ වූ අංක 1,850 දරන *ගැසට් පත්‍රයේ* I : III සහ IV (අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 1,851 - 2014 පෙබරවාරි මස 21 වැනි සිකුරාදා - 2014.02.21**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 264 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 265 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 271 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 276 |


*සැ. යු.- රෝයල් චැරිටි පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2014 ජනවාරි මස 31 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.*

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 මාර්තු මස 14 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 පෙබරවාරි මස 28 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*.

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

ප්‍රසම්පාදන දැන්වීමයි

**කලින් තෝරා ගන්නා ලද දුම්රිය ස්ථාන 45ක් සඳහා පවිත්‍ර කිරීමේ සේවාවන් සැපයීම සඳහා ප්‍රසම්පාදනය**

කොළඹ 10, ඕල්කොට් මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන) හි, සභාපති විසින් පූර්වයෙන් තෝරා ගන්නා ලද දුම්රිය ස්ථාන 45ක් සඳහා පවිත්‍රකිරීමේ (ජැනිටෝරියල්) සේවාවන් සැපයීම සඳහා, දැනටමත් රාජ්‍ය සහ/හෝ පෞද්ගලික අංශයේ ආයතන සඳහා, එම පවිත්‍රතා සේවා සැපයීම අරභයා, ප්‍රමාණවත් පළපුරුද්දක් ඇති, පිළිගත් සමාගම්වලින් මුද්‍රා තබන ලද ලංසු දැන් කැඳවනු ලැබේ.

02. ලංසු, ආපසු ගෙවනු නොලබන රු. 2,500 ක් පමණක් වන ලිපි ලේඛන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2014.02.24 වැනි දින ප. ව. 3.00 දක්වා කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍ර මත පමණක් ඉදිරිපත් කළ යුතු ය.

03. ලංසු භාරගැනීම, 2014.02.25 වැනි දින ප. ව. 2.00 ට අවසන් වන අතර, එකී වේලාව ඉක්ම වූ වහාම, කොළඹ 10, ඕල්කොට් මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, සාමාන්‍යාධිකාරී කාර්යාලයේ දී එම ලංසු විවෘත කරනු ලැබේ. මෙම ලංසු විවෘත කිරීමේ අවස්ථාවට පැමිණ සිටින ලෙස ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

04. මුද්‍රා තබන ලද ලංසු පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනැවිත් භාරදීම හෝ කළ යුතු ය.

සභාපති,<br>
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),<br>
ශ්‍රී ලංකා දුම්රිය සේවය,<br>
දුම්රිය මූලස්ථානය,<br>
ඕල්කොට් මාවත, කොළඹ 10.

05. ලංසු ලිපි ලේඛන කොළඹ 10, ඕල්කොට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ දී නොමිලේ පරීක්ෂා කර බැලිය හැකි ය. වැඩිදුර විස්තර ලබා ගැනීම සඳහා කරුණාකර පහත ලිපිනයෙන් විමසන්න.

දුම්රිය ගබඩා අධිකාරී,<br>
ශ්‍රී ලංකා දුම්රිය සේවය,<br>
ඕල්කොට් මාවත, කොළඹ 10<br>
දුරකථන අංක : 2438078 හෝ 2436818<br>
ෆැක්ස් අංකය : 2432044

සභාපති,<br>
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),<br>
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය SRS/F. 7043

02-586

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

ප්‍රසම්පාදන දැන්වීමයි

**ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙත කෝච් ස්ක්‍රෑස් 30,000ක් ක්‍රොසින් බෝල්ට් ඇන්ඩ් නට්ස් 2,000ක් රාත්තල් 88ක් බර ෆිෂ් ප්ලේට් ජෝඩු 3,000ක් හා රාත්තල් 80ක් බර ෆිෂ් ප්ලේට් ජෝඩු 3,000ක් සැපයීමේ ප්‍රසම්පාදනය**

පහත සඳහන් අයිතමයන් මිල දී ගැනීම සඳහා ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කට් මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ප්‍රධාන දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති තැන විසින් නිෂ්පාදකයින්/ සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු සඳහා දැන් ඇරයුම් කෙරේ.

| *අයිතම අංක* | *විස්තරය* | *ප්‍රමාණය* |
|---|---|---|
| 1. | කෝච් ස්ක්‍රෑස් | 30,000ක් |
| 2. | ක්‍රොසින් බෝල්ට්ස් (මිමී 22 x මිමී 114) | 2,000ක් |
| 3. | රා. 88 ෆිෂ් ප්ලේට්ස් | ජෝඩු 3,000ක් |
| 4. | රා. 80 ෆිෂ් ප්ලේට්ස් | ජෝඩු 3,000ක් |

ඇටෝර්නි බලය පවරනු ලැබූ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි පිළිගත් නියෝජිතයෙකු මඟින් හෝ සෘජුවම ලංසුකරුවන්ට තම ලංසු ඉදිරිපත් කළ හැක.

02. ආපසු නොගෙවන ශ්‍රී ලංකා රුපියල් 3,000ක් හෝ නිදහසේ පරිවර්තනය කළ හැකි සමාන මුදල් වර්ගයකින් ලියවිලි ගාස්තුව වශයෙන් ගෙවා, ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයෙන් හෝ විදේශයන්හි ශ්‍රී ලංකා දූත මෙහෙවර කාර්යාලවලින් 2014.03.06 වැනි දින ශ්‍රී ලංකා වේලාවෙන් ප. ව. 3.00 දක්වා ලබාගත හැකි ආකෘතිපත් මත සටහන් කරන ලද ලංසු පමණක් ඉදිරිපත් කළ යුතුයි.

03. 2014.03.07 වැනි දින ශ්‍රී ලංකා වේලාවෙන් ප. ව. 2.00 ට ලංසු භාරගැනීම අවසන් කරනු ලැබේ.

04. ISO 9001 : 2000/BS. EN ISO 9001 : 2000 සහතික ලත් හෝ මිල දී ගන්නාට පිළිගත හැකි සමාන ජාත්‍යන්තර ප්‍රමිති කළමනාකරණ පද්ධති ප්‍රමිතීන්ට අනුගත ආයතනවලින් නිෂ්පාදනය/සැපයුම් කරනු ලබන අයිතම පමණක් භාරගනු ලැබේ.

05. ලංසු භාරගැනීම අවසන් කළ වහාම එම ලංසු, ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කට් මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය සේවා මූලස්ථානයේ දී විවෘත කරනු ලබන අතර, ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට මෙම අවස්ථාවට සහභාගි වන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

06. මුද්‍රා තබන ලද ලංසු ලියාපදිංචි තැපැලෙන් හෝ අතින් රැගෙන විත් පහත ලිපිනය වෙත භාරදිය යුතු යි.

සභාපති,
ප්‍රධාන දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය මූලස්ථානය,
ඕල්කට් මාවත, කොළඹ 10,
ශ්‍රී ලංකාව.

07. ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ දී ගාස්තුවකින් තොරව ලංසු ලියවිලි පරීක්ෂා කළ හැකි අතර, වැඩිමනත් විස්තර සඳහා කරුණාකර ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කට් මාවතේ දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුවේ දුම්රිය ගබඩා අධිකාරී තැන දුරකථන අංක 94 (11) 2438078 හෝ 94 (11) 2436818 ඔස්සේ සම්බන්ධ වන්න.

සභාපති,
ප්‍රධාන දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F. 7076

02-587

# බඩු බාහිරාදිය විකිණීම්

**දෙහිඅත්තකණ්ඩිය මහෙස්ත්‍රාත් අධිකරණය**

අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ සහ මෙතෙක් හිමිකම් නොකියන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. දෙහිඅත්තකණ්ඩිය මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරනු ලැබූ සහ මෙතෙක් හිමිකම් නොකියන ලද සහ කල් තබා ගැනිමේ දී විනාශ වී යා හැකි භාණ්ඩ 2014.03.08 වැනි දින පෙ.ව. 10.00 සිට එම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් වන කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම් පාන්නකු වේ නම්, වෙන්දේසිය පවත්වන දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර, ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු අතර, ඒ පිළිබඳ සලකා බැලීම සඳහා අදාළ භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කරනු ලැබේ.

03. අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසර මත වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2 කට මත්තෙන් නියමිත භාණ්ඩ පරීක්ෂා කර බැලීමට මහජනයාට ඉඩ දෙනු ලැබේ.

04. අධිකරණය විසින් ඉදිරිපත් කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි, එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර දැමීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේ භාණ්ඩ මිල දී ගන්නා ගැණුම්කරුවන් තම අනන්‍යතාවය සනාථ කිරීමට ජාතික හැඳුනුම්පත රැගෙන ඒම අනිවාර්යය වේ.

06. භාණ්ඩ මිළ දී ගැනීම ලංකාවේ වලංගු මුදලින් කළ යුතු අතර, ඒ සඳහා අධිකරණය මගින් රිසිට්පතක් නිකුත් කරනු ලැබේ.

07. මිලදී ගන්නා භාණ්ඩ, වෙන්දේසි දින ප.ව. 4.30 ට පෙර වෙන්දේසි භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

චාමර වික්‍රමනායක
මහෙස්ත්‍රාත් - දෙහිඅත්තකණ්ඩිය.

2014 ජනවාරි මස 27 වැනි දින,
දෙහිඅත්තකණ්ඩිය මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**වෙන්දේසි භාණ්ඩ ලැයිස්තුව**

| *අනු. අංකය* | *නඩු අංකය* | භාණ්ඩ |
|---|---|---|
| 01 | 4099 | සවල් 02 යි |
| 02 | 6586 | සවල් 01 යි |
| 03 | 5063 | සවල් 01 යි, අඩිය හිල් සහිත බාල්දි 01 යි, වේවැල් කූඩ 01 යි |
| 04 | 1971 | සවල් 04 යි, උදලු 01 යි |
| 05 | 2544 | සවල් 02 යි |
| | ඒආර් 834/12 | උදලු 01 යි |
| 07 | 1088 | උදලු 01 යි |
| | 3416 | උදලු 01 යි |
| 09 | 44354 | උදලු 01 යි |
| 10 | 5577 | ලොරි ටියුබ් 01 යි |
| 11 | 5575 | ලොරි ටියුබ් 01 යි |
| 12 | 5164 | වයර් පාර්සල් 01 යි, හෝල්ඩර් 01, බල්බ 01 |
| 13 | 5795 | වයර් පාර්සල් 01 යි හෝල්ඩර් 01, බල්බ 01 |
| 14 | 5793 | වයර් පාර්සල් 01 යි හෝල්ඩර් 01, බල්බ 01 |
| 15 | 6885 | වඩු උපකරණ කට්ටලය |
| 16 | 6633 | දුනු තරාදි 01 යි |
| 17 | 6682 | දුනු තරාදි 01 යි |
| 18 | 7160 | දුනු තරාදි 01 යි |
| 19 | 6796 | තැටි තරාදි 01 යි |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ |
|---|---|---|
| 20 | 6841 | තැටි තරාදි 01 යි |
| 21 | 7199 | තරාදි 01 යි |
| 22 | 7295 | තරාදි 01 යි |
| 23 | බී 832/04 | පොරව 01 යි |
| 24 | 7102 | උදලු 04 යි, පිකස් 01, අලවංගු 02 යි. පිහි 01, කපන කටු 01 |
| 25 | 61063 | පොරව 01 යි, පිහිය 01 යි |
| 26 | 62767 | පොරොව 01 යි, කැති 01 |
| 27 | 73749 | වැය 01 යි |
| 28 | 77492 | පොරොව 01 යි |
| 29 | බී 272/13 5960 | ප්ලාස්ටික් කිරි කෑන් 01 යි, ඇලුමිනියම් කෑන් 01 යි, ආහාර පිසින භාජන, ටෙන්ට් රෙදි, විදුලි පන්දම් 01 යි, ඉටි රෙදි කෑලි 02 යි |
| 30 | 41359 | ඇලුමිනියම් මුට්ටි 01 |
| 31 | ඒආර් 658/08 | මුරිච්චි 02 යි |
| 32 | 2107 | 108-1502 යතුරු පැදිය |
| 33 | 8930 | 150-4211 යතුරු පැදිය |
| 34 | 715 | එස්.ජී. -4149 අත් ට්‍රැක්ටරය (අමතර කොටස් සඳහා) |
| 35 | 3761 | එස්.සී. - 8176 අත් ට්‍රැක්ටරය |
| 36 | 4000 | අත් ට්‍රැක්ටරය (අමතර කොටස් සඳහා) |
| 37 | 52065 | අත් ට්‍රැක්ටරය (අමතර කොටස් සඳහා) |
| 38 | 3600 | කරත්ත 01 යි |
| 39 | 4347 | කරත්ත 01 යි පොරෝ 01 යි |
| 40 | 4349 | කරත්ත 01 පොරෝ 01 යි |
| 41 | 4345 | කරත්ත 01 පොරෝ 01 යි |
| 42 | 4350 | කරත්ත 01 පොරෝ 01 යි |
| | 4346 | කරත්ත 01 පොරෝ 01 යි |
| 44 | 76630 බී 1394/10 | ජංගම දුරකථන 01යි |
| 45 | 3825 | ජංගම දුරකථන 01 |
| 46 | 32126 | පා පැදි 01 |
| 47 | 67177 | පා පැදි 01 |
| 48 | ඒආර්/136/11 | පා පැදි 01 |
| 49 | ඒආර්/814/08 | පා පැදි 01 |
| 50 | ඒආර්/295/12 | පා පැදි 01 |
| 51 | 56955 | පා පැදි 01 |
| 52 | 67312 | පා පැදි 01 |
| 53 | ඒආර් 777/12 | පා පැදි 01 |
| 54 | අංක රහිත | යකඩ බට 01 යි |
| 55 | අංක රහිත | පොරොව 02 යි |
| 56 | අංක රහිත | බෝර කටු 01 යි |
| 57 | අංක රහිත | අලි ආරක්ෂාවට යොදන වානේ කම්බි අඩංගු මලු 01 යි |
| 58 | අංක රහිත | ඉල්ලම්කුරු 01 යි |
| 59 | අංක රහිත | ඉලෙක්ට්‍රොනික් තරාදි 02 යි මේස තරාදි 05 යි |
| 60 | අංක රහිත | බිම් තරාදිවල උඩ කොටසක් |
| 61 | අංක රහිත | මැටි මුට්ටියක්, මැටි කලයක් |
| 62 | අංක රහිත | ඇලුමිනියම් මුට්ටි 02 යි |
| 63 | අංක රහිත | කුඩා වීදුරු කිහිපයක් |
| 64 | අංක රහිත | කඹ හා නයිලෝන් ලනු අඩංගු මලු 01 යි |
| 65 | අංක රහිත | ඇලුමිනියම් කල 01 යි |
| 66 | අංක රහිත | ට්‍රැක්ටර් ටියුබ් 01 |
| 67 | අංක රහිත | අමුණන ලද ටෝච් 01 |
| 68 | අංක රහිත | විදුලි පන්දම් 01 යි |
| 69 | අංක රහිත | වක් පිහි 01 යි |
| 70 | අංක රහිත | පැ ලකුණු කරන ලද පිහි 01 යි |
| 71 | අංක රහිත | පීරි 01 යි |
| 72 | අංක රහිත | විවිධ ප්‍රමාණයේ පිහි 20 යි |
| 73 | අංක රහිත | ස්කුරුප් නියන් 01 |
| 74 | අංක රහිත | උදලු 01 |
| 75 | අංක රහිත | පොරෝ 03 යි |
| 76 | අංක රහිත | යකඩ ඉනි 01 යි |
| 77 | අංක රහිත | කම්බි අඩු 01 යි |
| 78 | අංක රහිත | යකඩ බට 01 යි |
| 79 | අංක රහිත | කම්බි කුරු 04 |
| 80 | අංක රහිත | රතු නිල් පටි ඔතන ලද වක් පිහි 01 යි |
| 81 | අංක රහිත | කැඩී ගිය කැබිනට් කොටස් 01 යි |
| 82 | අංක රහිත | පිහියක් සහිත වේවැල් කිහිපයක් |
| 83 | අංක රහිත | අල්ලු 02 ලඹ 01 යි |
| 84 | අංක රහිත | රෙදි මහන මැෂිමක උඩ කොටස |
| 85 | අංක රහිත | යූ.පී.කො. හෙල්මට් 01 යි |
| 86 | අංක රහිත | ටෝච් 02 යි |
| 87 | අංක රහිත | ප්ලග් වයර් 01 යි |
| 88 | අංක රහිත | කුඩා රේඩියෝ 01 යි |
| 89 | අංක රහිත | ලොකු ටියුබ් 10 යි |
| 90 | අංක රහිත | ප්ලාස්ටික් පුටු 03 යි ස්ටූල් 01 යි |
| 91 | අංක රහිත | වයර් අඩංගු තැඹිලි පාට මලු 01 යි |
| 92 | අංක රහිත | පිහි තල 01 යි |
| 93 | අංක රහිත | අත් ට්‍රැක්ටර් කොටස් අඩංගු මලු 01 යි |
| 94 | අංක රහිත | ලොකු ටියුබ් 01 යි |
| 95 | අංක රහිත | ඇලුමිනියම් මුට්ටි 01 යි |
| 96 | අංක රහිත | ගෑස් ලිපක කොටසක් |
| 97 | අංක රහිත | දෑකැති 01 යි |
| 98 | අංක රහිත | අත් පොරෝ 01 යි |
| 99 | අංක රහිත | පා පැදි 01 |
| 100 | අංක රහිත | පා පැදි 01 |
| 101 | අංක රහිත | පා පැදි 01 |
| 102 | අංක රහිත | පා පැදි 01 |
| 103 | අංක රහිත | පා පැදි 01 |
| 104 | අංක රහිත | අබලන් පා පැදි ප්‍රමාණයක් |
| 105 | අංක රහිත | තරාදි කම්බි 04 යි |
| 106 | අංක රහිත | ට්‍රැක්ටරයක යකඩ කොටසක් හා පුලියක් |
| 107 | අංක රහිත | රේඩියෝ කොටස් හා කම්බි කුරක් |
| 108 | අංක රහිත | ඩීසල් ප්‍රමාණයක් අඩංගු කළු බූලි 01 යි |
| 109 | අංක රහිත | දිරාගිය මිට ඇති දෑකැත්තක් හා පොරවක් |
| 110 | අංක රහිත | කහපාට හයිඩ්‍රොලික් පොම්ප 02 යි |
| 111 | අංක රහිත | ෆයිබර් ඔරු 01 යි |
| 112 | අංක රහිත | ෆයිබර් ඔරු 01 යි |
| 113 | අංක රහිත | ෆයිබර් ඔරු 01 යි |
| 114 | අංක රහිත | හිස් බෝතල් කේස් කිහිපයක් |
| 115 | අංක රහිත | හිස් ප්ලාස්ටික් බූලි කීපයක් |
| 116 | අංක රහිත | දර කැබලි තොගයක් |

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ |
|---|---|---|
| 117 | අංක රහිත | ඇලුමිනියම් බාල්දි මුට්ටි කිහිපයක් |
| 118 | අංක රහිත | හිස් වීදුරු බෝතල් ප්‍රමාණයක් |

**අධිකරණ ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමෙන් පසු ඉවත් කරන ලද අබලි ද්‍රව්‍ය**

| | |
|---|---|
| 119 | වැහිපීලි කිහිපයක් |
| 120 | සිවිලිමට ගසා තිබූ ලී කැබලි තොගයක් |
| 121 | දොර පියන් කිහිපයක් |
| 122 | ජනෙල් පියන් කිහිපයක් |
| 123 | විදුලි පංකා කිහිපයක් (අබලන්) |
| 124 | දිරා ගිය කටු කම්බි තොගයක් |
| 125 | යකඩ ගේට්ටු පියන් 02 ක් |
| 126 | ටියුබ් ලයිට් ආවරණ තොගයක් (දිරා ගිය) |
| 127 | යකඩ දැල් කිහිපයක් |
| 128 | පරාල කැබලි කිහිපයක් |

02-501

---

**මහාධිකරණය - කැගල්ල**

**අධිකරණය වෙත ඉදිරිපත් කරන ලදුව රාජසන්තක කරනු ලැබූ හා පාවිච්චියෙන් ඉවත් කර ඇති භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

කැගල්ල මහාධිකරණයේ නඩුවලට අදාළ රාජසන්තක කරන ලද හා මෙතෙක් හිමිකම් නොපාන ලද භාණ්ඩ ද, අධිකරණ ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමේ දී ප්‍රයෝජනයට ගත නොහැකිව ඉවත් කරන ලද උපකරණ ද, භාණ්ඩ වට්ටෝරු පොතෙන් ඉවත් කරන ලද කාර්යාල උපකරණ ද, පහත දැක්වේ. එම උපලේඛනයේ සඳහන් භාණ්ඩ 2014.03.21 වැනි දින පෙ. ව. 10.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් වන කිසියම් භාණ්ඩයක් පිළිබඳව හිමිකම් දක්වන්නේ නම් වෙන්දේසිය පවත්වන දිනයේ පෙ. ව. 9.30 ට පෙර හිමිකම් තහවුරු කළ යුතුයි.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත වෙන්දේසිය පැවැත්වෙන දින පෙ. ව. 8.00 සිට 9.00 දක්වා වෙන්දේසියේ විකිණීමට සූදානම් කර ඇති ද්‍රව්‍යයන් පරීක්ෂා කර බැලිය හැකි ය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගන්නා අවස්ථාවේ දී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ බලය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිලදී ගන්නා භාණ්ඩ එම අවස්ථාවේ මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. සියලුම ගෙවීම් මුදල් වලින් ගෙවිය යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

06. භාණ්ඩ මිලදී ගන්නා සෑම අයෙකුම තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්ය වන අතර, මිලදී ගන්නා සියලුම භාණ්ඩ එදින ප. ව. 4.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

ඊ. ඒ. ජී. ආර්. අමරසේකර,
මහාධිකරණ විනිසුරු,
කැගල්ල.

2014 ජනවාරි මස 31 වැනි දින,
කැගල්ල මහාධිකරණයේ දී ය.

**උපලේඛනය**

| අනු අංකය | නඩු අංකය | | භාණ්ඩ පිළිබඳ විස්තරය |
|---|---|---|---|
| 01. | 3064/11 | | පොරව 01යි |
| 02. | 1886/03 | | පොරව 01යි |
| 03. | 2151/05 | | වයර් කැබලි කීපයක් |
| 04. | 2314/06 | | මේස පිහි 01යි |
| 05. | 2608/09 | | පිහියා 01යි |
| 06. | 2533/06 | | පිහියා 01යි |
| 07. | 2369/06 | | පිහියා 01යි |
| 08. | 2843/08 | | පිහියා 01යි |
| 09. | 2435/06 | | පිහියා 02යි |
| 10. | 2624/07 | | පාපැදි 01යි |
| 11. | 1512/00 | | පාපැදි 02යි |
| 12. | 2486/06 | | ලුමාලා වර්ගයේ පාපැදි 01යි |
| 13. | 2496/06 | (i) | අලවංගු 01යි |
| | | (ii) | පිහිය 01යි |
| 14. | 3104/11 | (i) | ගෑස් ටැංකි 01යි |
| | | (ii) | බොක්ස් පැනර් 01යි |
| 15. | 1936/03 | | අඩි 02ක් පමණ දිග යකඩ පොලු 01යි |
| 16. | 2918/09 | (i) | උදලු 01යි |
| | | (ii) | පිරි 01යි |
| | | (iii) | පිහිය 01යි |
| 17. | 1745/02 | | කුඩා දැල් කැබලි 02යි |
| 18. | 2044/04 | | කැති 01යි |
| 19. | 1509/00 | (i) | කැති 01යි |
| | | (ii) | මෝල්ගස් 01යි |
| 20. | 3082/11 | (i) | කැඩී ඇති වාහන කැසට් යන්ත්‍ර 01යි |
| | | (ii) | කුඩා ස්පීකර් 01යි |
| 21. | 2351/06 | | විදුලි පන්දම් 01යි |
| 22. | 2628/07 | | විදුලි පන්දම් 01යි |
| 23. | 2829/08 | (i) | අඩි 02ක් පමණ දිග රෙදිපටි වලින් වියන ලද පාපිසි 23 |
| | | (ii) | රෙදිපටි මලු 01යි |
| 24. | 2947/10 | | උදලු 01යි |
| 25. | 3129/11 | (i) | යකඩ ඉනි 01යි |
| | | (ii) | කම්බි තද කරන යකඩ ඉනි 01යි |
| | | (iii) | උදලු 01යි |
| | | (iv) | මිටි 02යි |
| | | (v) | කුඩා වේවැල් කුඩ 01යි |
| | | (vi) | කටර් අඩු 01යි |
| | | (vii) | උදලු මුල්ලු 01යි |
| 26. | 2625/07 | (i) | දිරාපත් රිම් එක සහිත ටයර් 01යි |
| | | (ii) | රිම් 01යි |
| 27. | 1893/08 | | මිට සහිත උදලු 01යි |

| අනු. අංකය | නඩු අංකය | | භාණ්ඩ පිළිබඳ විස්තරය |
|---|---|---|---|
| 28. | 1796/02 | (i) | පිහියා 01යි |
| | | (ii) | පොරව 01යි |
| 29. | 1875/03 | | විවිධ ලෝහවලින් නිපදවා ඇති ව්‍යාජ රන් ආභරණ කීපයක් |
| 30. | 2990/10 | (i) | පිහියා 02යි |
| | | (ii) | කුඩ 01යි |
| 31. | 2643/07 | (i) | දැලි පිහි 02යි |
| | | (ii) | වජ් පිහි 01යි |
| | | (iii) | සෙරෙප්පු ජෝඩු 01යි |
| 32. | 2662/07 | (i) | හෙල්මට් 02යි |
| | | (ii) | කුඩ 01යි |
| 33. | 2206/05 | (i) | ලී පුටුවක් |
| | | (ii) | කනප්පුවක් |
| | | (iii) | උදැල්ලක් |

34. හිටපු මහාධිකරණ විනිසුරුතුමියගේ නිල රථයෙන් ඉවත් කරන ලද ගෙවී ගිය ටයර් 04යි

35. මහාධිකරණ විනිසුරු නිල නිවස හා ලේඛනාගාරය පුළුල් කිරීමේ දී ප්‍රයෝජනයට ගත නොහැකි ගොඩනැගිලි ද්‍රව්‍ය හා අබලන් වූ උපකරණ :

(i) අබලන් සීලිං ෆෑන් 05යි
(ii) වයර් කැබලි සමග ස්විච් කීපයක්
(iii) මේන් ස්විච් 01යි
(iv) ස්විච් බෝඩ් 01යි
(v) යතුරු තහඩු කිහිපයක්
(vi) කැඩී ඇති වතුර මෝටරයක්
(vii) සෙරමික් සින්ක් 01

02-547

---

**දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - මහියංගනය**

මහියංගන දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද නඩු භාණ්ඩ හා කාර්යාල භාවිතයෙන් ඉවත් කරන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. මහියංගන දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරන ලද හා හිමිකම් නොකියන ලද සහ නඩු අංක සොයා ගතනොහැකි වූ නඩු භාණ්ඩ ද කාර්යාල භාවිතයෙන් ඉවත් කරන ලද භාණ්ඩ 2014.03.08 වැනි දින පෙ. ව. 10.00 ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. වෙන්දේසි කරනු ලබන කිසියම් භාණ්ඩයක් පිළිබඳව අයිතිවාසිකම් කියන්නෙකු වේ නම් ඒ පිළිබඳව වෙන්දේසිය පවත්වනු ලබන දින පෙ. ව. 9.00 සිට පෙ. ව. 10.00 දක්වා ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතු ය. පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් භාරගනු නොලැබේ.

03. වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2 කට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය පරිදි මහජනයාට පරීක්ෂා කර බැලිය හැකි වේ.

04. වෙන්දේසියෙන් මිල දී ගන්නා භාණ්ඩ ඒ වේලාවේ දී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර සියලුම ගෙවීම් මුදල්වලින් පමණක් කළ යුතු ය.

05. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවේ දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

06. වෙන්දේසි භාණ්ඩ ඉල්ලීමට පැමිණෙන්නන් තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

07. වෙන්දේසිය සම්බන්ධව පැමිණිලි කිසිවක් තිබේ නම් වෙන්දේසිය පවත්වන අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු අතර වෙන්දේසියෙන් පසුව ලැබෙන පැමිණිලි කිසිවක් භාර ගනු නොලැබේ.

08. වෙන්දේසියෙහි විකුණනු ලබන වාහන සම්බන්ධයෙන් මෝටර් රථ පරීක්ෂකවරයා විසින් අබලි ලෙස නම් කර ඇති වාහන සඳහා නැවත ගැණුම්කරු නමින් ලියාපදිංචි කිරීමකට කිසිදු ලේඛනයක් අධිකරණයෙන් ලබා දෙනු නොලැබේ.

ගීතානි විජේසිංහ,
දිසා විනිසුරු සහ මහෙස්ත්‍රාත්,
මහියංගනය.

2014 ජනවාරි මස 29 වැනි දින,
මහියංගනය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**වෙන්දේසියට නියමිත භාණ්ඩ ලැයිස්තුව**

| අනු. අංකය | නඩු අංකය | | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|---|
| 01. | මැකී ඇත | 1. | ජාතක කථා පොත් | 01 |
| | | 2. | ජාතක කථා පොත් | 01 |
| 02. | එම | | බැරල් තහඩු (මද වශයෙන් දිරාපත්) | 15 |
| 03. | එම | | ප්ලාස්ටික් බැරල් | 02 |
| 04. | එම | | තහඩු බැරල් | 30 |
| 05. | එම | 1. | පාවිච්චි කරන ලද ඇලුමිනියම් මුට්ටි (ලොකු) | 02 |
| | | 2. | පාවිච්චි කරන ලද ඇලුමිනියම් මුට්ටි (කුඩා) | 04 |
| 06. | එම | | හිල් සහිත යකඩ බාල්දි | 15 |
| 07. | එම | | ප්ලාස්ටික් බූලි (ලොකු) | 05 |
| 08. | එම | | ප්ලාස්ටික් බෝතල් ඇසුරුම් | 06 |
| 09. | එම | | යකඩ ඉනි | 05 |
| 10. | එම | | පිහි | 03 |
| 11. | එම | | සවල් | 25 |
| 12. | එම | | විදුලි පන්දම් | 08 |
| 13. | එම | | ජංගම දුරකථන චාජර් | 03 |
| 14. | එම | | දිග අඩි 07 ඉරුම් කියත් | 06 |
| 15. | එම | | මද වශයෙන් දිරාපත් යකඩ රාමු කොටස් | 03 |
| 16. | එම | | ගැරුම් වට්ටි | 04 |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 17. | මැකී ඇත | කැට කුඩා | 05 |
| 18. | එම | ශීතකරණයක පිටත කොටස් (හවුසින්) අබලි | 01 |
| 19. | එම | දිග අඩි 14 අඟල් 2 පළල යකඩ බට | 04 |
| 20. | එම | මද වශයෙන් දිරාපත් ඇලුමිනියම් කොරහ | 01 |
| 21. | එම | තලා අබලි කරන ලද තඹ දඟර | 15 |
| 22. | එම | මද වශයෙන් දිරාපත් ටියුබ් බල්බ් රදවන | 15 |
| 23. | එම | දිග අඩි 06 විශ්කම්භය අඩි 1 1/2 කොන්ක්‍රීට් සිලින්ඩර් | 02 |
| 24. | එම | ප්ලාස්ටික් කෑන් කුඩා | 15 |
| 25. | එම | වයර් කැබලි තොග | 01 |
| 26. | එම | පුලුස්සා ඇති කම්බි කැබලි (කේබල්) | 04 |
| 27. | එම | මද වශයෙන් දිරාපත් දර තොග | 01 |
| 28. | 93786 | කිරුම් පඩි භාවිතා කරන එල්ලන තරාදි | 01 |
| 29. | BR 1396/10 | ලියාපදිංචි අංක EPME 6443 දරන TVS යතුරු පැදිය | 01 |
| 30. | 87354 | ලියාපදිංචි අංක රහිත අත්ට්‍රැක්ටරය (අබලි) | 01 |
| 31. | 82535 | ලියාපදිංචි අංක රහිත අත්ට්‍රැක්ටරය (අබලි) | 01 |
| 32. | 89840 | ලියාපදිංචි අංක රහිත අත්ට්‍රැක්ටරය (අබලි) | 01 |
| 33. | 82538A | ලියාපදිංචි අංක රහිත අත්ට්‍රැක්ටරය (අබලි) | 01 |
| 34. | 82857 | ලියාපදිංචි අංක රහිත අත්ට්‍රැක්ටරය (අබලි) | 01 |
| 35. | 85880 | ලියාපදිංචි අංක රහිත අත්ට්‍රැක්ටරය (අබලි) | 01 |
| 36. | අංක රහිත | ලියාපදිංචි අංක රහිත අත්ට්‍රැක්ටරය (අබලි) | 01 |
| 37. | 71920 | ලියාපදිංචි අංක UPQU 3020 ත්‍රී රෝද රථ | 01 |
| 38. | අංක රහිත | වැලි කියුබ් | 25 |

**ඇමුණුම : 02 ආයතන බඩු වට්ටෝරු පොතෙන් ඉවත් කරන ලද භාණ්ඩ :**

| | | | |
|---|---|---|---|
| 39. | අංක රහිත | කුෂන් පුටු (ඇඳි රහිත අබලි) | 01 |
| 40. | අංක රහිත | ස්ටෙප්ලර් යන්ත්‍ර (අබලි) | 02 |
| 41. | අංක රහිත | අංක 965022 දරන හල්ඩා වර්ගයේ යතුරු ලියනය (අබලි) | 01 |
| 42. | අංක රහිත | අංක 965091 දරන හල්ඩා වර්ගයේ යතුරු ලියනය (අබලි) | 01 |
| 43. | අංක රහිත | අංක 965058 දරන හල්ඩා වර්ගයේ යතුරු ලියනය (අබලි) | 01 |
| 44. | අංක රහිත | ෆැක්ස් යන්ත්‍ර (අබලි) | 02 |

01-469

## රුවන්වැල්ල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කර ඇති නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. රුවන්වැල්ල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරන ලද හිමිකම් නොකියන ලද හා නඩු අංක සොයාගත නොහැකි වූ පහත සඳහන් භාණ්ඩ 2014.03.08 වැනි දින පෙ. ව. 10.00 ට මෙම අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. මෙම වෙන්දේසි කරනු ලබන කිසියම් භාණ්ඩයක් පිළිබඳ ව අයිතිවාසිකම් කියන්නෙකු වේ නම්, ඒ පිළිබඳව වෙන්දේසිය පවත්වනු ලබන දින පෙ. ව. 9.00 සිට පෙ. ව. 10.00 දක්වා ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතු ය.

03. වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2කට ෙ පර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය පරිදි මහජනයාට පරීක්ෂා කර බැලිය හැකි වේ.

04. වෙන්දේසියෙන් මිල දී ගන්නා භාණ්ඩ ඒ අවස්ථාවේ දී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කරගත යුතු අතර, සියලුම ගෙවීම් මුදල් වලින් පමණක් කළ යුතු ය.

05. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවේ දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

06. වෙන්දේසියෙන් භාණ්ඩ ඉල්ලීමට පැමිණෙන්නන් තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

07. වෙන්දේසිය සම්බන්ධයෙන් පැමිණිලි කිසිවක් තිබේ නම්, වෙන්දේසිය පවත්වන අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු අතර, වෙන්දේසියෙන් පසුව ලැබෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

කෝසල සේනාධීර,
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්.

2014 පෙබරවාරි මස 21 වැනි දින,
රුවන්වැල්ල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| අනු. අංකය | නඩු අංකය | | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|---|
| 01. | 40079 | (i) | ෂෙල් ගෑස් සිලින්ඩර් | 01 |
| | | (ii) | විවෘත ගෑස් ලිප් | 01 |
| 02. | 39744 | (i) | ලාෆ් ගෑස් සිලින්ඩර් | 01 |
| | | (ii) | තලා කැබලි කල තඹ බට කොටස් | - |
| | | (iii) | ප්ලාස්ටික් බේසම් | 01 |
| 03. | 29988 | (i) | විවෘත ගෑස් ලිප් | 01 |
| | | (ii) | ගෑස් සිලින්ඩර් | 01 |
| 04. | 32737 | (i) | නිල් පාට ගෑස් සිලින්ඩර් | 01 |
| | | (ii) | තලා කැබලි කල තඹ බට කොටස් | - |
| | | (iii) | විවෘත ගෑස් ලිප් | 01 |
| 05. | 40810 | (i) | බටය සහිත විවෘත ගෑස් ලිප් | 01 |
| | | (ii) | ෂෙල් වර්ගයේ ගෑස් සිලින්ඩර් | 01 |
| 06. | 43316 | (i) | ලාෆ් ගෑස් සිලින්ඩර් | 01 |
| | | (ii) | කොටස් කර තලන ලද තඹ බට | - |
| | | (iii) | විවෘත ගෑස් ලිප් | 01 |
| 07. | 41030 | (i) | කහපාට ගෑස් සිලින්ඩරය | 01 |
| | | (ii) | විවෘත ගෑස් ලිප් | 01 |

| අනු. අංකය | නඩු අංකය | | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|---|
| 08. | 81944 | | නිල්පාට ගෑස් සිලින්ඩර් | 01 |
| 09. | 92136 | | කහපාට ගෑස් සිලින්ඩර් | 01 |
| 10. | 35424 | (i) | ඔක්සිජන් මැෂින් | 01 |
| | | (ii) | ඔක්සිජන් සිලින්ඩර් | 01 |
| | | (iii) | ඇදුම් උදළු | 02 |
| 11. | 35425 | (i) | ඔක්සිජන් මැෂින් | 01 |
| | | (ii) | ඔක්සිජන් ටැංකි | 01 |
| 12. | 35426 | (i) | ඔක්සිජන් ටැංකි | 01 |
| | | (ii) | වැලි කුඩ | 01 |
| 13. | 12638 | | කි. ග්‍රෑම් 100 දුණු තරාදි | 01 |
| 14. | 12641 | | කි. ග්‍රෑම් 10 දුණු තරාදි | 01 |
| 15. | 12639 | | කි. ග්‍රෑම් 100 දුණු තරාදි | 01 |
| 16. | 12637 | | කි. ග්‍රෑම් 10 දුණු තරාදි | 01 |
| 17. | 12643 | | කි. ග්‍රෑම් 100 දුණු තරාදි | 01 |
| 18. | 12645 | | කි. ග්‍රෑම් 10 දුණු තරාදි | 01 |
| 19. | 95745 | | දුණු තරාදි | 01 |
| 20. | 58274 | | දුණු තරාදි | 01 |
| 21. | 91064 | | තැටි තරාදි | 01 |
| 22. | 55452 | | තැටි තරාදි | 01 |
| 23. | 43329 | | දුණු තරාදි | 01 |
| 24. | 13970 | | දුණු තරාදි | 01 |
| 25. | 58283 | | තැටි තරාදි | 01 |
| 26. | 90438 | (i) | සවල් | 01 |
| | | (ii) | වැලිකුඩ | 01 |
| 27. | 26611 | | ප්ලාස්ටික් බේසම් | 01 |
| 28. | 44939 | | සීරියල් අංක S CD 172 දරන සිංගර් වර්ගයේ අධි ශීතකරණ | 01 |
| 29. | B 3680/11 | | 5' ප්‍රමාණයේ පිත්තල කුකුලා පහන් | 01 |
| | | | 2 1/2' ප්‍රමාණයේ පිත්තල මල් පෝච්චි | 02 |
| 30. | B 3748/97 | | පරණ ඇලුමිනියම් කිරිතැටි | 14 |
| 31. | 2903 | | අබලන් තෙල් ඉසින ටැංකි | 02 |
| 32. | 92193 | | බාල්දි | 02 |
| 33. | 45817 | | 33290528 අංක දරන මෝස්තර අංක H 700L දරන SIMSON වර්ගයේ අධි ශීතකරණය | 01 |
| 34. | 6039/10 | | කොළ පාට ත්‍රිරෝද රථ බක්කි | 01 |
| 35. | 48639 | | අංක තහඩු නොමැති ට්‍රැක්ටර් එන්ජින් | 01 |
| | | | 28" විෂ්කම්භය ඇති රවුම් කියත් | 01 |
| | | | ලී අට්ටාල | 01 |
| | | | ට්‍රැක්ටරය පණ ගන්වන හැඬල් | 01 |
| 36. | 42637 | (i) | සබ්මැෂිබල් වර්ගයේ වතුර මෝටර් | 01 |
| | | (ii) | 24' දිග පටි හෝස් | 02 |
| | | (iii) | 5. 4' දිග අලවංගු | 01 |
| | | (iv) | උදළු | 02 |
| | | (v) | යකඩ තාච්චි | 01 |
| | | (vi) | 260' දිග වයර් රෝල් | 01 |
| 37. | 46325 | | 28" විෂ්කම්භය ඇති රවුම් කියත් | 01 |
| 38. | අංක රහිත | | වාහන ෂීට් | 01 |
| 39. | අංක රහිත | | පරණ වීල්බැරෝ | 01 |
| 40. | අංක රහිත | | කොළ පාට චේන් බොලොක්ක | 01 |
| 41. | අංක රහිත | | නූල් 8 ප්‍රමාණයේ යකඩ කම්බි තොගයක් | - |
| 42. | අංක රහිත | | යකඩ බට | 03 |
| 43. | අංක රහිත | | ඔක්සිජන් ටැංකි | 01 |
| 44. | අංක රහිත | | ලී හිරමණ | 01 |
| 45. | අංක රහිත | (i) | ලී කව්ච්චි | 01 |
| | | (ii) | අබලන් කව්ච්චියක කොටස් | - |
| 46. | අංක රහිත | | අබලන් පාපැදි | 02 |
| 47. | අංක රහිත | | ට්‍රැක්ටර් එන්ජින් | 01 |
| 48. | අංක රහිත | | ලොකු ඇලුමිනියම් මුට්ටි | 01 |
| 49. | අංක රහිත | | සවල් | 15 |
| 50. | අංක රහිත | | CAMRY දුණු තරාදි | 01 |
| 51. | අංක රහිත | | ICHIBA වර්ගයේ දුණු තරාදි | 01 |
| 52. | අංක රහිත | | CAPACITY වර්ගයේ දුණු තරාදි | 01 |
| 53. | අංක රහිත | | BUDRY වර්ගයේ දුණු තරාදි | 01 |
| 54. | අංක රහිත | | FIVE GOAT වර්ගයේ දුණු තරාදි | 01 |
| 55. | අංක රහිත | | පරණ තැටි තරාදි | 06 |
| 56. | අංක රහිත | (i) | වාහන ටයර් | 02 |
| | | (ii) | ටියුබ් | 01 |
| 57. | අංක රහිත | | කුෂන් ෂීට් | 01 |
| 58. | අංක රහිත | | ලොකු ලෝහ බාල්දි | 02 |
| 59. | අංක රහිත | | නිල්පාට පොඩි බැරල් | 01 |
| 60. | අංක රහිත | | නයිලෝන් කඹ | 01 |
| 61. | අංක රහිත | | පිත්තල කුඩා මල් පෝච්චි | 02 |
| 62. | අංක රහිත | | විවෘත ගෑස් ලිප් | 03 |
| 63. | අංක රහිත | | යකඩ බාල්දි | 02 |
| 64. | අංක රහිත | (i) | තැලී ගිය ඇලුමිනියම් ඇතිලි | 01 |
| | | (ii) | තැලී ගිය ඇලුමිනියම් මුට්ටි | 02 |
| 65. | අංක රහිත | | වක් කැති | 01 |
| 66. | අංක රහිත | | 4 1/2' ක් පමණ දිග යකඩ ඉණි | 01 |
| 67. | අංක රහිත | | උණ ආවරණය සහිත පලංචි කියත් | 01 |
| 68. | අංක රහිත | | බෝතල් මූඩි සවිකරන යන්ත්‍ර | 01 |
| 69. | අංක රහිත | | ලන්තෑරුම් පහන් | 01 |
| 70. | අංක රහිත | | PRESIDENT වර්ගයේ ලොකු වාහන බැටරි | 01 |
| 71. | අංක රහිත | | DAGENITE වර්ගයේ ලොකු වාහන බැටරි | 01 |
| 72. | A 7990 | | ඔක්සිජන් මැෂින් | 01 |
| 73. | B 4778 | | නිල්පාට ග්‍රයින්ඩර් මැෂින් | 01 |
| 74. | B 8148 | | MITSHU වර්ගයේ චාජ් කරන ටෝච් | 01 |
| 75. | 26222 | | නොකියා වර්ගයේ 1100 දරන ජංගම දුරකථන (බැටරිය රහිත) | 01 |
| 76. | අංක රහිත | | QUARTS වර්ගයේ බිත්ති ඔරලෝසු | 01 |
| 77. | අංක රහිත | | වාහන ජැක් | 01 |

**කාර්යාලයේ භාවිතයෙන් ඉවත් කරන ලද භාණ්ඩ**

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 78. | - | ගලවන ලද පැරණි වැහිපිහිලි සහ පී. වී. සී. බට තොගය | |
| 79. | - | පරණ සිවිලින් ෆෑන් | 01 |

# රජයේ නොවන දැන්වීම්

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නම : ස්කයිකොම් ලංකා (පී වී ටී) එල් ටී ඩී
ලියාපදිංචි අංකය : පී වී 96694
ලියාපදිංචි ලිපිනය : අංක E/LG/12 ඩයස් පෙදෙස, ගුණසිංහපුර, කොළඹ 12.

සමාගම් අධ්‍යක්ෂකවරු.

02-458

---

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නම : රුදැල්ල ඔටෝමොබයිල්ස් (පී වී ටී) එල් ටී ඩී
ලියාපදිංචි අංකය : පී වී 96678
ලියාපදිංචි ලිපිනය : අංක 43, ආචාර්ය එන්. එම්. පෙරේරා මාවත, කොළඹ 08.

සමාගම් අධ්‍යක්ෂකවරු.

02-459

---

**ශ්‍රී ලංකාවේ ඉතාලි තානාපති කාර්යාලයේ දී සහතික කරන ලද 2009.02.13 දිනැති විශේෂ ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම**

හික්කඩුව, වවුලගොඩ, කන්ද උඩපාර, දහනායක ගොඩවත්ත, අංක 43/5 හි පදිංචි රණසිංහ වීරක්කොඩි ලීලාවතී වන මා ශ්‍රී ලංකාවේ ඉතාලි තානාපති කාර්යාලයේ තානාපතිතුමන් ඉදිරියේ ලියා සහතික කරන ලද විශේෂ ඇටෝර්නි බලපත්‍රයෙන් හික්කඩුව, වවුලගොඩ, මහගෙදර වත්ත, පදිංචි චන්ද්‍රසේන ගොන්සල්කෝරාල මහතා වෙත පවරන ලද ඇටෝර්නි බලය මෙයින් ප්‍රත්‍යා දිෂ්ඨ කරමින් අවලංගු කරන අතර, ඔහු විසින් මා වෙනුවෙන් සිදු කරනු ලබන කිසිදු ක්‍රියාවක් වෙනුවෙන් මා වගකීමක් නොදරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

02-463

---

**අංක 6158 සහ 2008.11.27 දිනැති විශේෂ ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම**

හික්කඩුව, වවුලගොඩ, කන්ද උඩපාර, දහනායක ගොඩවත්ත, අංක 43/5 හි පදිංචි හොරවල විතානගේ සසංක ලීලානන්ද වන මා ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් ප්‍රේමරත්න තිරාණගම මහතා විසින් ලියා සහතික කළ අංක 6158 හා 2008.11.27 වැනි දින දරන ඇටෝර්නි බලපත්‍රයෙන් හික්කඩුව, වවුලගොඩ, මහගෙදර වත්ත, පදිංචි චන්ද්‍රසේන ගොන්සල්කෝරාල මහතා වෙත පවරන ලද ඇටෝර්නි බලය මෙයින් ප්‍රත්‍යා දිෂ්ඨ කරමින් අවලංගු කරන අතර, ඔහු විසින් මා වෙනුවෙන් සිදු කරනු ලබන කිසිදු ක්‍රියාවක් වෙනුවෙන් මා වගකීමක් නොදරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

02-464

---

**ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම**

පානදුර, අම්බලන්දූව අංක 237 හි පදිංචි මොහමඩ් ෆලීල් මොහමඩ් සියාඩ් වන මා විසින් පානදුර ප්‍රසිද්ධ නොතාරිස් ෆාතිමා සුහ්රියා විසින් ලියා සහතික කරන ලද අංක 1212 හා 2013.02.02 දින දරන ඇටෝර්නි බලපත්‍රය යටතේ පානදුර අම්බලන්දූවේ අංක 232 හි පදිංචි වදූද් මොහමඩ් ෆයිරූස් යන අයට ප්‍රදානය කළ ඇටෝර්නි බලය වහාම බලපැවැත්වෙන පරිදි අහෝසි කරන ලද බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට හා එහි ජනතාවට මෙයින් දැනුම් දෙමි.

02-465

---

**සමාගමේ නාමය වෙනස් කිරීම**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය යටතේ නාමය වෙනස් කිරීම පිළිබඳ නිවේදනයයි.

සමාගමේ පෙර පැවති නාමය : අයි. ඩී. ලංකා ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී බී 984
සමාගමේ ලියාපදිංචි ලිපිනය : මෙල්ෆර්ට් එස්ටේට්, කොතලාවල, කඩුවෙල
සමාගමේ නව නාමය : ඉන්ටර්නැෂනල් ඩිස්ටිලර්ස් ලිමිටඩ්

ඉන්ටර්නැෂනල් ඩිස්ටිලර්ස් ලිමිටඩ් වෙනුවෙන්

ජේ සී ඇන්ඩ් කම්පනි,
සමාගම් ලේකම්වරු.

02-466

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය අනුව පහත සමාගම සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : මෙඩි ෆස්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : PV 96579
ලියාපදිංචි කාර්යාල ලිපිනය : අංක 419/C, රන්මුතුගල, කඩවත.

02-507

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව අගසර පබ්ලිෂර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (පෞද්ගලික) සීමිත වගකීම් සමාගමෙහි නම අගසර (ප්‍රයිවට්) ලිමිටඩ් ලෙස 2010ක් වූ ජූලි මස 14 වැනි දින වෙනස් කරන ලදී.

සමාගමේ නම : අගසර පබ්ලිෂර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 70139
ලියාපදිංචි ලිපිනය : අංක 10, පළමු පටුමග, ජම්බුගස්මුල්ල මාවත, නුගේගොඩ
සමාගමේ නව නම : අගසර (ප්‍රයිවට්) ලිමිටඩ්

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජී. මහාබඳුගේ,
ලේකම්.

දුරකථන අංක : 071 8244495/ 077 8197041

02 511

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව අගසර පබ්ලිෂර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (පෞද්ගලික) සීමිත වගකීම් සමාගමක් ලෙස 2009 නොවැම්බර් මස 26 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : අගසර පබ්ලිෂර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 76720
ලියාපදිංචි ලිපිනය : අංක 10, පළමු පටුමග, ජම්බුගස්මුල්ල මාවත, නුගේගොඩ

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජී. මහාබඳුගේ,
ලේකම්.

දුරකථන අංක : 071 8244495/ 077 8197041

02-512

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 09 වැනි වගන්තිය ප්‍රකාරව වගකීමෙන් සීමාසහිත සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳව කෙරෙන ප්‍රසිද්ධ දැන්වීමයි

සමාගමේ නම : ප්ලැට්ෆෝම් ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 87182
ලියාපදිංචි කර දිනය : 2012.07.20
ලියාපදිංචි ලිපිනය : ලෙවල් 12 ඒ, 1/1, ග්‍රෙගරීස් පාර, කොළඹ 07.

සමාගම් ලේකම්.

02-541

---

### ඇටෝර්නි බලය අවලංගු කිරීමයි

තලවතුගොඩ, මාදිවෙල පාර, අංක 572/2 දරන ස්ථානයෙහි පදිංචි මාපලානගම ආරච්චිගේ ශිරෝමා මල්කාන්ති වන මම එම ලිපිනයේ ම පදිංචි තලවතුගොඩ, මාදිවෙල පාර, අංක 572/2 දරන ස්ථානයෙහි පදිංචි මාපලානගම ආරච්චිගේ ගාමිණී යන අය වෙත පවරන ලද ප්‍රසිද්ධ නොතාරිස් වින්ධ්‍යා කුමාරි විජේරත්න සිරිවර්ධන මහත්මිය විසින් ලියා සහතික කළ අංක 126 සහ වර්ෂ 2013ක් වූ අගෝස්තු මස 27 වැනි දිනැති විශේෂ ඇටෝර්නි බලපත්‍රය අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ඨ කළ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි. මින් ඉදිරියට මාපලානගම ආරච්චිගේ ගාමිණී නමැති අය මා වෙනුවෙන් කරනු ලබන කිසිදු ක්‍රියාවක් හෝ ගණුදෙනුවක් සම්බන්ධයෙන් මා වගකීමක් භාර ගනු නොලබන බවද, සියලු දෙනා ම මෙයින් දැන ගනිත්වා.

මාපලානගම ආරච්චිගේ ශිරෝමා මල්කාන්ති.

02-538

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 09 වැනි වගන්තිය ප්‍රකාරව වගකීමෙන් සීමාසහිත සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳව කෙරෙන ප්‍රසිද්ධ දැන්වීමයි.

සමාගමේ නම : සිස්ටම් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 92351
ලියාපදිංචි කර දිනය : 2013.05.03
ලියාපදිංචි ලිපිනය : අංක 49, ජයතිලක මාවත, පානදුර.

එල්. එල්. රදී වයි. ද සිල්වා,
සමාගම් ලේකම්.

02-537

### සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 09 (1) වැනි වගන්තිය යටතේ මහජනයා වෙත කරන දැන්වීමයි

සමාගම් නාමය : ඇමරේසියන් රිසෝසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : PV 96679
ලියාපදිංචි කළ දිනය : 2014.01.23
කාර්යාල ලිපිනය : අංක 61/9, ධර්මපාල මාවත, කොළඹ 03.

එල්. එම්. මැනේජ්මන්ට් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ්,
ලේකම්වරු.

අංක 291/32 ඒ,
හැව්ලොක් උද්‍යානය,
හැව්ලොක් පාර,
කොළඹ 05.

02- 516

---

### ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නාමය : ක්ලැසික් ලයිට්ං (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 96730
ලියාපදිංචි ලිපිනය : අංක 680/එච්/4, නාරංගොඩලුව, බටුවත්ත
සංස්ථාගත කළ දිනය : 2014 ජනවාරි 27

සමාගමේ ලේකම්.

02-514

---

### 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධානවලට අනුව දැනුම්දීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන වලට අනුව පහත සඳහන් සමාගම සංස්ථාපනය කර ඇති බව මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමු.

01. සමාගමේ නම : මොණරාගල නර්සිංහෝම් (ප්‍රයිවට්) ලිමිටඩ්
02. ලියාපදිංචි අංකය : පී. වී. 82007
03. සංස්ථාගත කළ දිනය : 2011 ඔක්තෝබර් මස 20 වැනි දින.

02-579

### දැන්වීමයි

පහත සඳහන් සමාගම ලියාපදිංචි කිරීම පිළිබඳ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : කප්රුක ලංකා (පුද්ගලික)
සමාගමේ අංකය : පී බී 74594
ලියාපදිංචි කාර්යාලය : ඕස්ට්‍රේලියන් මයිග්‍රේෂන් කන්සල්ටන්ට්ස් සිනමන් ලේක් සයිඩ්, බිම් මහල, අංක 115, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02, ශ්‍රී ලංකාව.
ලියාපදිංචි කළ දිනය : 2010.09.29

ඉහත සඳහන් සමාගම වෙනුවෙන් එහි ලේකම්,

එල්. ඒ. පතිරවිතාන,
නීතිඥ,
ප්‍රසිද්ධ නොතාරිස් සහ සමාගම් ලේකම්.

අංක 179/13, වැලිවිට පාර,
මාලබේ.
දුරකථන අංකය : 077 3738532.

02-576/1

---

### සමාගමක් සංස්ථාගත කිරීමක් පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර දැන්වීමයි

සමාගමේ නාමය : ඔක්ස්ෆර්ඩ් ඉම්පෝට්ස් එක්ස්පෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 96384
සංස්ථාගත කළ දිනය : 2014 ජනවාරි මස 06 වැනි දින
ලියාපදිංචි කාර්යාලය : අංක 34, ශාන්ත සෙබස්තියන් කන්ද, කොළඹ 12.

චාට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගමේ ලේකම්වරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

02-576/2

---

### සමාගමක නාමය වෙනස් කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගමේ නාමය (8 වගන්තිය ප්‍රකාරව), 2011 ජනවාරි මස 26 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වෙනස් කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ පැවති නාමය : චාට් ටැක්ස් ඉන්ටෙලිජන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 14545
සමාගමේ ලිපිනය : අංක 141/3, වොක්ෂෝල් වීදිය, කොළඹ 02
සමාගමේ නව නාමය : ආර් සී ටැක්ස් කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්)ලිමිටඩ්

චාට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගමේ ලේකම්වරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

02-576/3

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියේ ප්‍රකාරව කරනු ලබන දැනුම් දීමයි

සමාගම් නාමය : ඉන්ක්ලුසිව් ෆයිනැන්ස් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 70934
ලියාපදිංචි ලිපිනය : අංක 18/බී, සුහුතිපුර පාර, බත්තරමුල්ල.

සඳුන් ගමගේ,
සමාගම් ලේකම්.

02-565

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම 2014 ජනවාරි මස 29 වැනි දින සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : පර්මැක් සොලූෂන්ස් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී. වී. 96766
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 25/4, මොන්ට් විස්ටා, මංචනායක වත්ත පෙදෙස, වලව්වත්ත පාර, ගංගොඩවිල, නුගේගොඩ

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

බිස්නස් සොලූෂන්ස් ඇන්ඩ් සෙක්‍රට්‍රීස්
(පුද්ගලික) සමාගම.

02-564

---

## දැන්වීමයි

හුංගම, කිවුල, අංක 11 දරන ස්ථානයේ පදිංචි ගයා ක්‍රිෂාන්ත අබේදීර ජයවික්‍රම වන ම විසින් ප්‍රසිද්ධ නොතාරිස් සුගතදාස කාරියවසම් මහතා ලවා සහතික කරවන ලද අංක 157 සහ 2002.08.03 දිනැති ඇටර්නි බලපත්‍රය මගින් එකී ඇටර්නි බලපත්‍රයේ සඳහන් කාරණා ඉටු කිරීම සඳහා හුංගම, කිවුල, අංක 11 දරන ස්ථානයේ පදිංචි නිමල් අබේදීර ජයවික්‍රම වෙත ලබා දී ඇති ඇටර්නි බලය 2014.02.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කර ඇති බවත් එකී දිනයෙන් පසු එකී ඇටර්නි බලපත්‍රය යටතේ නිමල් අබේදීර ජයවික්‍රම විසින් කරනු ලබන කිසිදු ගණුදෙනුවක් සම්බන්ධයෙන් මා වගකීමට නොබැඳෙන බවත් ශ්‍රී ලංකාවාසී සියලුදෙනා වෙත මෙයින් නිවේදනය කර සිටිනු ලැබේ.

ගයා ක්‍රිෂාන්ත අබේදීර ජයවික්‍රම.

2014 පෙබරවාරි මස 06 වැනි දින.

02-606

---

## විශේෂ ඇටෝර්නි බලපත්‍රයක් ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

ශ්‍රී ලංකාවේ, කොළඹ 3, ගාලු පාරේ, අංක 75 දරන ස්ථානයෙහි ක්‍රෙස්කැට් රෙසිඩන්සීස්හි අංක 11-3සී/4ඩී දරන ස්ථානයෙහි පදිංචි ෂිරාන් ක්‍රිෂාන්ත් ඩයස් (අංක 640501162 වී දරන ජාතික හැඳුනුම්පත හිමි) වන මම කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. ආර්. පීරිස් විසින් සහතික කරන ලදුව, බත්තරමුල්ල රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය විසින් පවත්වාගෙන යනු ලබන ලේඛනවල අංක 99 දරන දින පොතෙහි 51 වැනි පත් ඉරුවෙහි 4695 දරන වෙලුමෙහි ලියාපදිංචි කර ඇති, ශ්‍රී ලංකාවේ, කොළඹ 03, ගාලු පාරේ අංක 75 දරන ස්ථානයෙහි ක්‍රෙස්කැට් රෙසිඩන්සීස් හි අංක 11-3සී/4ඩී දරන ස්ථානයෙහිම පදිංචි පර්ල් ප්‍රින්සි ඩයස් (අංක 395260308 වී දරන ජාතික හැඳුනුම්පත හිමි) නමින් නිකුත් කරන ලද අංක 1415 සහ 2012 ජුනි මස 26 වැනි දින දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගුකර ප්‍රත්‍යාදිෂ්ඨ කරන බවත් ඒ සඳහා මාගේ වගකීමක් නොමැති බවත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට සහ පොදු මහජනතාව වෙත මෙයින් දැනුම් දී සිටිමි.

ෂිරාන් ක්‍රිෂාන්ත් ඩයස්.

02-609

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) ඡේදය :-

සමාගමේ නම : ෂෙන්ඩින් ඉන්ටර්නැෂනල් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 95535
ලියාපදිංචි කාර්යාලය : අංක 489/3 ඒ, තිඹිරිගස්යාය පාර, කොළඹ 05.

සමාගමේ නම : වන්ස්ටොප් සිම් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 95944
ලියාපදිංචි කාර්යාලය : අංක 2, ඩී, පැල්මයිරා කෝට්, පැල්මයිරා ඇවනිව්, කොළඹ 03

සමාගමේ නම : ලයිකා ෆ්ලයි (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 96006
ලියාපදිංචි කාර්යාලය : ලෙවල් 6, ඊස්ට් ටවර්, වර්ල්ඩ් ට්‍රේඩ් සෙන්ටර්, කොළඹ 1

සමාගමේ නම : එස් පී සියේරා ජොයින්ට් වෙන්චර් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 96152
ලියාපදිංචි කාර්යාලය : 3 වැනි මහල, අංක 385 ගාලු පාර, කොළඹ 03

සමාගමේ නම : ටෙක්ලීවර් සොලූෂන්ස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 96181
ලියාපදිංචි කාර්යාලය : ලේකම්වරුන්ගේ භාරයේ, බිම් මහල, "සයුරු සෙවන " අංක 46/12, නවම් මාවත, කොළඹ 02.

සමාගමේ නම : සිංහ රාවණ ලොජිස්ටික්ස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 96162
ලියාපදිංචි කාර්යාලය : අංක 69/14, කටුමාන, නුවරඑළිය.

02-630

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාගත කිරීම පිළිබඳ නිවේදනය

සමාගමේ නම : තෝ ඩිවලොප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 96440
ලියාපදිංචි කාර්යාලය : අංක 409, තුන් වැනි මහල, ගාලු පාර, කොළඹ 03.

ඉහත සමාගම වෙනුවෙන් ,

බ්‍රැන්ඩික්ස් මැනේජ්මන්ට් සර්විසස් (පුද්ගලික) සමාගම.

409, තුන් වැනි මහල, ගාලු පාර,
කොළඹ 03.

02-635/1

---

## පොදු නිවේදනය

සමාගමක් සංස්ථාගත කිරීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 61) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාගත කිරීම පිළිබඳ නිවේදනය

සමාගමේ නාමය : නිර්හිත ඇඩ්වෙන්චර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 96512
ලියාපදිංචි කාර්යාලය : අංක 409, 3 වැනි මහල, ගාලු පාර, කොළඹ 03.

ඉහත සමාගම වෙනුවෙන්

බ්‍රැන්ඩික්ස් මැනේජ්මන්ට් සර්විසස් (පුද්ගලික) සමාගම.

අංක 409, තුන් වැනි මහල, ගාලු පාර,
කොළඹ 03.

02-635/2

---

## සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9 (1) වැනි වගන්තිය යටතේ මහජනයා වෙත කරන දැන්වීමයි

සමාගම් නාමය : ප්‍රෙස්ටීජ් ගෲප් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 96760
ලියාපදිංචි කළ දිනය : 2014.01.28
කාර්යාල ලිපිනය : අංක 410/ඒ, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.

එල්. එම්. මැනේජ්මන්ට් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ්,
ලේකම්වරු.

අංක 291/32 ඒ,
හැව්ලොක් උද්‍යානය,
හැව්ලොක් පාර,
කොළඹ 05.

02-637/1

---

## සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9 (1) වැනි වගන්තිය යටතේ මහජනයා වෙත කරන දැන්වීමයි

සමාගම් නාමය : පී ජී කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 96734
ලියාපදිංචි කළ දිනය : 2014.01.27
කාර්යාල ලිපිනය : අංක 410/ඒ, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.

එල්. එම්. මැනේජ්මන්ට් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ්,
ලේකම්වරු.

අංක 291/32 ඒ,
හැව්ලොක් උද්‍යානය,
හැව්ලොක් පාර,
කොළඹ 05.

02-637/2

---

## සමාගමක නම වෙනස්වීම සම්බන්ධයෙන් මහජනතාව වෙත කෙරෙන නිවේදනයයි

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගමේ නම 2014 ජනවාරි මස 28 වැනි දින සිට වෙනස් වූ බවට මෙයින් දන්වමු.

පෙර තිබූ නාමය : කාර්ගිල්ස් ඇග්‍රිකල්චර් ඇන්ඩ් කොමර්ෂල් බෑන්ක් ලිමිටඩ්
නව නාමය : කාර්ගිල්ස් බෑන්ක් ලිමිටඩ්
සමාගම් අංකය : පී බී 4847
ලියාපදිංචි කාර්යාලය : අංක 696, ගාලු පාර, කොළඹ 03.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සරෝජිනි දූනුවිල,
සමාගම් ලේකම්,
කාර්ගිල්ස් බෑන්ක් ලිමිටඩ්.

02-641

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**සෙලාන් බැංකුව පීඑල්සී - පරණ යොන් වීදිය ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

මෙම දේපළ කොළඹ 12, රාජසිංහම් ඉන්ඩස්ට්‍රීස් ප්‍රයිවට් ලිමිටඩ් යන අය බන්ධනදායි වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ මැද පත්තුවේ, ගම්පහ ප්‍රාදේශීය සභා සීමාව තුළ ඉහළ යාගොඩ ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. ඒ. පී. ඒ. රංජිත් විසින් සාදන ලද 1999.06.02 දිනැති අංක 242 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන යාගොඩ එස්ටේට් නමැති ඉඩමේ කැබලි අංක ඕ 1 ලකුණු කළ (බලයලත් මිනින්දෝරු කේ. ඒ. රූපසිංහ විසින් සාදන ලද 1986.11.04 දිනැති අංක 544/1986 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කැබලි අංක පී සහ ඕ වල කොටස් එකතු කර නැවත මැනීමක් වන) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස පර්චස් දාහතරයි දශම පහයි තුනක් (අක්. 0 රූ. 0 පර්. 14.53) විශාල ඉඩම.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, මැද පත්තුවේ, ගම්පහ ප්‍රාදේශීය සභා සීමාව තුළ ඉහළ යාගොඩ ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. ඒ. පී. ඒ. රංජිත් විසින් සාදන ලද 1999.06.02 දිනැති ඉහත කී අංක 241 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන යාගොඩ එස්ටේට් නමැති ඉඩමේ කැබලි අංක පී 1 ලකුණු කළ (බලයලත් මිනින්දෝරු කේ. ඒ. රූපසිංහ විසින් සාදන ලද 1986.11.04 දිනැති අංක 544/1986 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කැබලි අංක පී හි කොටසක නැවත මැනීමක් වන) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස පර්චස් දහසයයි දශම අටයි බිංදුවක් (අ. 0 රූ. 0 පර්. 16.80) විශාල ඉඩම.

ඉහත සඳහන් දේපළ 2014 මාර්තු මස 18 වැනි දින පෙරවරු 11.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම ආරම්භ කරනු ලැබේ.

*දේපළට පිවිසීම.* - කොළඹ නුවර ප්‍රධාන මාර්ගයේ 24 වන කි. මී. කණුව පිහිටි බැලුම්මහර පාසල මංසන්ධියෙන් ඉහළ යාගොඩ පාරට හැරී තවත් කි. මී. 2ක් පමණ ඉදිරියට ගිය විට ඇලුමිනියම් කර්මාන්ත ශාලාවට යාබදව අදාල දේපළ පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම.- රජයේ ගැසට් පත්‍රයේ* 2007.11.23 වැනිදින පළ වී ඇති අතර ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2007.10.26 වැනි දින ද වීරකේසරී පුවත්පතේ 2007.10.25 වැනි දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරී බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක්. 3. වෙන්දේසි කරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500, 6. සියලුම ප්‍රචාරක වියදම්. ගැණුම් මිලෙන් ඉතිරි 90% විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකළ යුතු ය.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමනාකාරිණිය (නීති), සෙලාන් බැංකුව, පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක : 011- 2456476, 2456480, 2456484.

තුසිත කරුණාරත්න, (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත,
කොලොන්නාව,
දුරකථන අංක : 011 - 3068185, 011-2572940.

02-596

---

**සෙලාන් බැංකුව පීඑල්සී - පුත්තලම ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

මෙම දේපළ මදුරන්කුලිය ව්‍යාපාර ලියාපදිංචි අංක 35-640 දරන මෙසර්ස් ඒ. ආර්. රාහමන් ඒ. ආර්. රහීම් එක්ස්පෝර්ට් යන නාමය විලාශය සහ අභිධානය යටතේ ඒකපුද්ගල ව්‍යාපාරයක් පවත්වාගෙන යන කාච්චි ඊබ්‍රහිම් මොහොමඩ් ඉස්මයිල් යන අය බන්ධනදායි වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, පුත්තලම් පත්තු කොට්ඨාසයේ, පුත්තලම් පත්තු දකුණ උණවෙල්ලි හි පිහිටි බලයලත් මිනින්දෝරු ටී. බාලචන්ද්‍රන් විසින් සාදන ලද 2007.08.07 දිනැති අංක 82 දරන සැලැස්මේ සඳහන් කරප්පිට්වායල් කානි නමැති ඉඩමේ ලොට් 01 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස අක්කර දොළහයි පර්චස් විසිහතයි දශම හතරයි දෙකක් (අ. 12, රූ. 0, පර්. 27.42) ක් විශාල ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

ඉහත සඳහන් දේපළ 2014 මාර්තු මස 20 වැනි දින පෙරවරු 11.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - කොළඹ පුත්තලම ඒ 3 ප්‍රධාන මාර්ගය ඔස්සේ 72 වැනි සැතපුම් කණුව දක්වා පැමිණ 10 වැනි සැතපුම් කනුව හංදිය ලෙස හඳුන්වන මංසන්ධියෙන් වම්පසට ඇති කනමූලයි මාර්ගයට හැරෙන්න. එම මාර්ගයේ තවත් මීටර් 50ක් පමණ ගොස් දුම්රිය හරස් මග පසුකළ විට දකුණු පසට ඇති මාර්ගයට හැරෙන්න. එම මාර්ගය ඔස්සේ තවත් මීටර් 125ක් පමණ ගිය විට මාර්ගයේ වම්පස අදාල දේපළ පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම. - රජයේ ගැසට් පත්‍රයේ* 2013.11.15 වැනි දින පළ වී ඇති අතර ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2013.11.14 වැනි දින ද තිනකුරල් පුවත්පතේ 2013.11.19 වැනි දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක්. 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500, 6. සියලුම ප්‍රචාරක වියදම්. ගැණුම් මිලෙන් ඉතිරි 90% විකිණීමේ දින සිට දින 30ක් ඇතුලත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකළ යුතු ය.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමණාකාරිණිය (නීති) සෙලාන් බැංකුව, පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක : 011- 2456475, 2456480.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව.
දුරකථන අංක : 011 - 3068185, 011 -2572940

02-559

---

**මහජන බැංකුව - පළමු වන නගර ශාඛාව (046)**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 වසරේ අංක 29 දරන මහජන බැංකු පනතෙහි 29ඩී වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

*උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තර.* - බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ අලුත්කුරු කෝරළේ රාගම පත්තුවේ වත්තල - මාබෝලේ නගර සභා සීමාව තුළ පිහිටියාවූ ද දෙල්ගහවත්ත යයි කියනු ලබන ඉඩමේ පර්චස් තුනයි දශම තුනයි එකක් (අක්. 0, රූඩ් 0, පර්. 3.31) සහ එහි පිහිටි ගොඩනැගිලි ද වේ.

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් වර්ෂ 2014 ක් වූ මාර්තු මස 08 වැනි දින පෙ. ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා 2008.09.05 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* සහ 2008.08.22 දිනමිණ සහ ඩේලිනිව්ස් පුවත්පත්වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමවලට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.* - හැඳල හන්දිය පසුකර කි. මී. 01ක් පමණ යාමේ දී මාබෝල, මීගමු පාරට මුහුණ ලා දකුණු පස අදාළ ස්ථානය පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැනුම් මිලෙන් 10%ක්,
2. පලාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරුගේ හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 1,000 ක් ද,
5. විකුණුම් වියදම් සමග කොමිස් ගාස්තු වෙතොත් එම මුදල් ද,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත මහජන බැංකුව, සහකාර ප්‍රාදේශීය කළමනාකරු, (කොළඹ දකුණ) ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, (බටහිර 01) අංක 11, ආදිපාද වීදිය, කොළඹ 01 වෙත ගෙවිය යුතු ය.

දුරකථන අංක : 2344982, 2393678
ෆැක්ස් අංකය : 4717009

හිමිකම් ඔප්පු සහ වෙනත් ආදල විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක. ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අර්වින් පෙරේරා,
(සාම විනිසුරු) වෙන්දේසිකරු
හා තක්සේරුකරු,
උසාවි කොමසාරිස් හා දිවුරුම්ලත්
භාෂා පරිවර්තක.

අංක 03, පාගොඩ පාර,
නුගේගොඩ.
දුරකථන අංක : 2810145,
071-8021206.

02-557

---

**මහජන බැංකුව - බදුල්ල මුතියංගන ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ වෝඩ් 2 හි කළුබෝවිල දුටුගැමුණු පාරේ පිහිටි වරිපනම් අංක 190/3 දරන "කහටගහලන්ද නොහොත් කහටගහවත් තුන්හවුල් කුරුදු වත්ත හෙවවකගහවත්ත යන ඉඩමේ කැබලි අංක "බී 1 ඒ" දරන කොටසේ ප්‍රමාණයෙන් පර්චස් දහ තුනයි දශම හතයි පහක් (අ. 0, රූ. 0, පර්. 13.75)ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි සෑම සියළු දේත් වේ.

(මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක එම්. 2725/126 හි ලියාපදිංචි කර ඇත.)

තවද : ඉහත කී ඉඩමට ප්‍රවේශ වීම සඳහා අඩි 30ක් පළල පාර සඳහා ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් දාසයයි දශම හයයි හයක් (අ. 0 රූ. 01 පර්. 16.66) ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි සෑම සියලු දේත් වේ.

මහජන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් වර්ෂ 2014ක් වූ මාර්තු මස 15 වැනි දින පෙ. ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා .- 2013.01.11 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* ද, 2013.01.17 වැනි දින දිනමිණ, ඩේලි නිව්ස් සහ තිනකරන් පුවත්පත් වල පළ කර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම* .- කොහුවල හන්දියේ සිට දුටුගැමුණු වීදිය දිගේ (කොළඹ - හොරණ ප්‍රධාන පාර) පාමංකඩ දෙසට මීටර් 200ක් පමණ යන්න. කොහුවල පොලිස් ස්ථානය පසු කරමින් පීටර් පෙරේරා මාවතට වමට හැරී මීටර් 400ක් පමණ යන්න. එම පාරට මායිම්ව වම් අත පැත්තේ මෙම දේපළට සමීප වීමට පුළුවන. (දුටුගැමුණු වීදිය ප්‍රධාන පාර පිටුපසින් ඇති දෙවැනි බිම් කට්ටිය, මෝටර් වාහනයකින් යාමට පුළුවන) බිම් කට්ටි "බී 1 ඒ" වේ.

*ගෙවීමේ ක්‍රමය*. - වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය :-

1. ගැණුම් මිලෙන් 10%ක් ද,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක් ද,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රුපියල් 1,000ක් ද,
5. විකුණුම් වියදම සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත ප්‍රාදේශීය කලමනාකාර මහතා, මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, අංක 24, ආර්. එච්. ගුණවර්ධන මාවත, බදුල්ල වෙත ගෙවිය යුතු ය. දුරකථන අංක 055 - 2222165, 055- 2222342, 055- 22223067 ෆැක්ස් අංකය : 055- 2222361.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙව්වහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත. හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ
තක්සේරුකරු (සාම විනිසුරු මුළු දිවයිනටම)

කාර්යාලය : 25 බී, බෙල්මන්ට් වීදිය,
කොළඹ 12.
දුරකථන අංක : 011- 5756356, 011- 2334808 (ෆැක්ස්)
දුරකථන (නිවස) 011- 2419126, 072- 3836742.

02-589

**හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - හල්ස්ඩෝප් ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පදිංචියට සුදුසු වටිනා දේපළක් .- බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ නවගමුව ගමේ පිහිටි "චන්ද්‍රගරවත්ත" නමැති ඉඩමේ ලොට් අංක "24" හි ප්‍රමාණයෙන් අක්කර බින්දුවයි රූඩ් බින්දුවයි පර්චස් දොළහයි දශම අටයි පහක් (අ. 0 රූ. 0 පර්. 12.85) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි සෑම සියලු දේ ද වේ.

මෙම දේපළ .- වෙද දේවගේ ජගත් රුවන් කුමාර ණයකරු වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. බී. පෙරේරා විසින් සහතික කරන ලද්දා වූ ද, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දාවූ ද, 2007.07.24, 2007.06.11 දිනැතිව පිළිවෙලින් අංක 2802 සහ 3231 දරන බැඳුම්කරයන් යටතේ ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපළට පිවිසීම*.- බොරැල්ල හන්දියේ සිට ඔරුගොඩවත්ත හන්දිය දක්වා දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත හි පැමිණ දකුණට හැරී අවිස්සාවේල්ල පාර (පරණ පාර) දිගේ වැල්ලම්පිටිය කඩුවෙල පසුකර නවගමුව හන්දිය දක්වා යන්න. ඉන් පසුව දකුණට හැරී සුමනතිස්ස මාවතට පැමිණ මීටර් 500ක් පමණ දුර යන්න. එතැන සිට වමට හැරී එල්. බී. ෆිනෑන්ස් ලිමිටඩ් විසින් විකුණනු ලබන බිම් කට්ටිය ඇති පාර දක්වා පැමිණි විට මෙම දේපළ හමුවේ. මෙම දේපළ හඳුන්වන්නේ බිම් කට්ටි 11 ලෙසට ය. බත්තරමුල්ල සහ කැලණිය පැත්තෙන් ද මෙම දේපළට පිවිසිය හැකි ය.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙතින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් වර්ෂ 2014 ක් වූ මාර්තු මස 17 වැනි දින පෙ. ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*යෝජනා සම්මුති දැන්වීම*. - 2010.02.25 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* ද, 2010.02.24 වැනි දින, ද අයිලන්ඩ් දිවයින සහ තිනකරන් පුවත්පත් වල පළකර ඇති යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*ගෙවීමේ ක්‍රමය*. - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය :-

1. ගැණුම් මිලෙන් 10%ක් (සියයට දහයක්),
2. ප්‍රාදේශීය සභා බදු සඳහා 1%ක් (සියයට එකක්),
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්),
4. ලිපිකරු හා සෝෂක වේතනය රුපියල් 1,000ක් සහ සියලුම ප්‍රචාරක වියදම් ද,
5. නොතාරිස් ගාස්තු හා විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රුපියල් 2,000ක් ද,

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30ක් ඇතුලත දී හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවා නිමකළ යුතු වේ. එකී 90% ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙව්වහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට

බැංකුවට අයිතිය ඇත. හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමනාකරු (අය කිරීම් අංශය) හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ
තක්සේරුකරු (සාම විනිසුරු මුළු දිවයිනටම)

දුරකථන අංක : 011-2661821, 011- 2661835
කාර්යාලය : 25 බී, බෙල්මන්ට් වීදිය, කොළඹ 12
දුරකථන අංක : 011- 5756356, 011- 2334808 (ෆැක්ස්)
072- 3836742.

02-588

---

**පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී එල් සී**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී එල් සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ 2014ක් වූ මාර්තු මස 14 වැනි දින පෙ. ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, පිටිගල් කෝරළේ දකුණේ, කම්මල් පත්තුවේ මාරවිල ලියාපදිංචි කොට්ඨාසයේ වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රන්ගම්මුල්ල අංක 483 ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ අන්ගම්පිටිය ග්‍රාමයේ පිහිටි (බලයලත් මිනින්දෝරු එම්. ජී. එස්. සමරතුංග විසින් සාදන ලද 2001.12.13 දිනැති අංක 4492 දරන පිඹුරේ දැක්වෙන ඒකාබද්ධ කැබලි අංක 1, 2 සහ 3 හි නැවත මැනීමක් වන) ගන්සූරියගහකුඹුර නොහොත් සූරියගහ කුමුර නැමැති ඉඩම මැන බලයලත් මිනින්දෝරු එම්. ජී. එස්. සමරතුංග විසින් සාදන ලද 2012.06.27 දිනැති අංක 6703 පිඹුරේ දැක්වෙන ලොට් 1 දරන කැබැල්ල සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදි සියලු දේත් ය.

විශාලත්වය : අ. 0, රූ. 0, පර්. 6.70

හලාවත ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. එස්. එන්. තිසේරා විසින් සහතික කරන ලද වර්ෂ 2012ක් වූ සැප්තැම්බර් මස 20 දිනැති අංක 1021 සහ වර්ෂ 2013ක් වූ සැප්තැම්බර් මස 03 දිනැති අංක 1409 දරන උකස්කරයන් මත ලැබිය යුතු මුදල් ගෙවීම සිදු කිරීම බන්ධනදායි ලෙස වර්ණකුලසූරිය මහතෙල්ගේ ෆ්‍රැන්ක් බැප්ටිස්ට් ටෝනි පීරිස් විසින් පැහැර හැර ඇති හෙයින් ද,

*යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා .-* 2014.02.07 වැනි දින ඩේයිලි නිවුස්, ලක්බිම, සුඩර් ඔලි පුවත්පත් සහ එදින ගැසට් පත්‍රද බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.-* පැන් ඒෂියා බැංකුවේ වෙන්නප්පුව ශාඛාවේ සිට කොළඹ හලාවත ප්‍රධාන මාර්ගයේ මීගමුව දෙසට බෝලවත්ත හන්දිය දක්වා කිලෝ මීටර් 5.5 පමණ ගියවිට කම්මල පාරට සහ කතෝලික ප්‍රතිමාවට යාබද ව දකුණු පසින් මෙම විෂයගත දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේ ම පහත සඳහන් වියදම් මුදල් වලින් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

(1) ගැණුම් මුදලෙන් 10% ක් ද (සියයට දහයක්),
(2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද, (සියයට එකයි) සහ වැට් බද්ද ද,
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2.5% ක්ද, (සියයට දෙකහමාරක්),
(4) විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද,
5) විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද (රු. 3,000).

වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගැණුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතු ය. එකී 90% ක ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙවුවහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල හිමිකම් ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාල තොරතුරු සඳහා කළමණාකරු, ණය අය කර ගැනීම් අංශය, පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී එල් සී, ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011- 4667218/011-2565573.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස් , තක්සේරුකරු සහ
බලයලත් වෙන්දේසිකරු.

අංක 134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක : 011- 2873656, 0777- 672082,
ෆැක්ස් අංකය : 011- 2871184.

02-603/1

---

**පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී එල් සී**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී එල් සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ 2014ක් වූ මාර්තු මස 14 වැනි දින පෙ. ව. 11.00 ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, පිටිගල් කෝරළේ දකුණේ, කම්මල් පත්තුවේ වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ

උල්හිටියාව දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ උල්හිටියාව ග්‍රාමයේ පිහිටි අඹගහවත්ත ඇත්දෙමටගහවත්ත සහ කොස්ගහවත්ත නමැති ඉඩම මැන බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ලක්ෂ්මන් එච්. ප්‍රනාන්දු විසින් සාදන ලද අංක 3121 දරන පිඹුරේ දැක්වෙන ලොට් 1 දරන ප්‍රමාණයෙන් පර්චස් විස්සක් (අ. 0 රූ. 0 පර්. 20.0) විශාලත්වය ඇති ඉඩම ද, බලයලත් මිනින්දෝරු වයි. එම්. රංජිත් යාපා විසින් මැන සාදන ලද අංක 7657 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් පර්චස් දෙකක් (අ. 0 රූ. 0 පර්. 2) විශාලත්වය ඇති ඉඩම ද, එම මිනින්දෝරුවරයාගේ ම අංක 7737 ඒ දරන පිඹුරේ ලොට් 1 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් පර්චස් හයයි දශම පහක් (අ. 0 රූ. 0 පර්. 6.5) විශාලත්වය ඇති ඉඩම සහ අංක 8822 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් පර්චස් දහයක් (අ. 0 රූ. 0 පර්. 10) විශාලත්වය ඇති ඉඩම සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සියලු දේත් ය.

විශාලත්වය : අ. 0 රූ. 0 පර්. 38.5

මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් එන්. එල්. ජී. කුරේ විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2008 මැයි මස 22 වැනි දිනැති අංක 5991 සහ වර්ෂ 2008 සැප්තැම්බර් මස 04 වැනි දිනැති අංක 6018 දරන උකස්කරයන් මත සහ හලාවත ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. එස්. එන්. තිසේරා විසින් සහතික කරන ලද වර්ෂ 2012ක් වූ සැප්තැම්බර් මස 21 දිනැති අංක 1023 සහ වර්ෂ 2013ක් වූ සැප්තැම්බර් මස 03 දිනැති අංක 1411 දරන උකස්කරයන් මත ලැබිය යුතු මුදල් ගෙවීම සිදු කිරීම බන්ධනදායි ලෙස වර්ණකුලසූරිය මහතෙල්ගේ ෆ්‍රෑන්ක් බැප්ටිස්ට් ටෝනි පීරිස් විසින් පැහැර හැර ඇති හෙයින් ද,

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2014.02.07 වැනි දින ඩේලි නිවුස්, ලක්බිම, සුඩර් ඔලි පුවත්පත් සහ එදින *ගැසට් පත* ද බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.*- කොළඹ නගර සීමාවේ පිහිටි පැලියගොඩ පාලමේ සිට පැලියගොඩ පුත්තලම ඒ 3 මහා මාර්ගය ඔස්සේ 46 වන කිලෝමීටර කණුව ආසන්නයේ (මීටර් 250කට පමණ කලින්) වම්පසින් ඇති කඩවත මාර්ගයට ළඟාවී පළමු පුද්ගලික පාර දක්වා තාර දමා ඇති කඩවත මාර්ගය දිගේ දකුණු පසට මහා මාර්ගය දිගේ මීටර් 150ක් පමණ ගියවිට මෙම විෂයගත දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේ ම පහත සඳහන් වියදම් මුදල්වලින් වෙන්දේසිකරුට ගෙවිය යුතු යඃ-

(1) ගැණුම් මුදලෙන් 10%ක් ද (සියයට දහයක්),
(2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් (සියයට එකයි) ද, සහ වැට් බද්ද ද,
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2.5ක් (සියයට දෙකහමාරක්) ද,
(4) විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද,
(5) විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු (රු. 3,000) ද.

වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගැණුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතු ය. එකී 90% ක ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙව්වහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල හිමිකම් ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාල තොරතුරු සඳහා කළමණාකරු - ණය අය කර ගැනීම් අංශය, පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී එල් සී, ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011- 4667218/011-2565573.

පී. කේ. ඊ සේනාපති,
උසාවි කොමසාරිස් , තක්සේරුකරු සහ
බලයලත් වෙන්දේසිකරු.

අංක 134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක : 011- 2873656, 0777- 672082
ෆැක්ස් අංකය : 011- 2871184.

02-603/2

---

**සම්පත් බැංකුව පී එල් සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

එම්. පී. එම්. එස්. ආරියවංශ
ගිණුම් අංක : 1056 5340 9199

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2009ක් වූ දෙසැම්බර් මස 17 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් විසි නම ලක්ෂ හාර දහස් එකසිය විසි දෙකයි ශත දහතුනක (රු. 29,04,122.13) මුදල ද, 2009 ඔක්තෝබර් මස 30 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් විසි හය ලක්ෂ අසූ හත් දහස් හයසිය අසූ පහයි ශත හැත්තෑ පහක (රු. 26,87,685.75) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසිඑකක් (21%) බැගින් වූ පොලිය ද, හා ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2011.05.20 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* , 2011.09.07 වැනි දින "දිවයින", "අයිලන්ඩ්" සහ "තිනකුරල්" දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2014 මාර්තු 20 වැනි දින පෙ. ව. 10.30 ට පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, උඩ හේවාහැට හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොහොක කෝරළේ හඟුරන්කෙත ප්‍රාදේශීය සභා සීමාවන් තුළ රිකිල්ලගස්කඩ ග්‍රාමයේ පිහිටි "ටවුන්ටන් එස්ටේට්" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ටී. බී.

අත්තනායක යන අය විසින් සාදන ලද 2008 මැයි මස 10 දාතම හා අංක 146ඒ/2008 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණයකොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් ඃ වයඹට ඃ පී. සී. පාර (රිකිල්ලගස්කඩ සිට මාකුරුප්ප දක්වා) ගිනිකොණට ඃ බලයලත් මානකතැන කේ. එම්. එච්. නවරත්න යන අය විසින් සාදන ලද අංක 10176/34 දරන පිඹුරේ ලොට් 1 එම ඉඩමේ කොටස, නිරිතට ඃ රිකිල්ලගස්කඩ සිට මාකුරුප්ප දක්වා පී. සී. පාර සහ බස්නාහිරට ඃ එම ඉඩමේ කොටසක් යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් දොළහක් (අ. 0 රූ. 1 පර්. 12) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන්ද වෙනත් අයිතීන් ද වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 146ඒ/2008 දරන පිඹුරට අනුවය.

එකී ලොට් 1 පහතින් මැනවින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි ඃ-

එකී රිකිල්ලගස්කඩ ග්‍රාමයේ පිහිටි "ටවුන්ටන් එස්ටේට්" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානකතැන කේ. එම්. එච්. නවරත්න යන අය විසින් සාදන ලද 1988 සැප්තැම්බර් මස 18 දාතම හා අංක 10176/34/2 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් , වයඹට ඃ ප්‍රධාන පාර (රිකිල්ලගස්කඩ සිට මාකුරුප්ප දක්වා), ගිනිකොණට ඃ අංක 10176/34 දරන පිඹුරේ ලොට් 1, නිරිතට ඃ මෙම ඉඩමේ ඉතිරි කොටසේ ඉම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් දොළහක් (අ. 0, රූ. 1 පර්. 12) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවයන් පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 10176/34/2 දරන පිඹුරට අනුව වෙලුම/පත්ඉරුව ආර් 322/2 යටතේ නුවරඑළිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

02-602

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.